චක්‍ර ලේඛ අංක : 11/95

මගේ අංකය: බප/සසේකො/ලේ.නි.
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
මහලේකම් කාර්යාලය,
03 වන මහල,
මාළිගාවත්ත,
කොළඹ 10.
1995 ජූලි මස 17 දින.

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිතිවල
සභාපතිවරුන් වෙත.

මහත්මයාණෙනි,

සේවක ණය - මාස 05 ක උපරිමයකට යටත්ව වැටුප් අත්තිකාරම්

සමුපකාර සේවකයින් සඳහා විධිමත් ණය පහසුකම් සැපයීමක් නොකෙරෙන බැවි මෙම කොමිෂන් සභාවේ අවධානයට යොමු විය. මේ නිසා සමුපකාර සමිතිවල මූල්‍ය තත්ත්වය හා සේවකයින්ගේ අවශ්‍යතාවය පිළිබඳව සලකා බලා සිය සේවකයින් සඳහා මාස 05 ක උපරිමයකට යටත්ව වැටුප් අත්තිකාරම් මුදලක් ලබා දීම සුදුසු බැව් කොමිෂන් සභාව තීරණය කරන ලදී.

1. සේවකයින් සඳහා මෙම ණය මුදල් ලබා දීමේදී පහත සඳහන් නියමයන් අනුගමනය යුතු වේ.

1.1 ණය ලබාගැනීමට සුදුසුකම්

I. සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සමිතියට අනුමත කරන ලද සේවක සංඛ්‍යාවට අයත් තනතුරක ස්ථිර පත්වීමක් ලබා සිටින අවුරුදු 05 කට නොඅඩු සේවයක් ඇති අයකු විය යුතු ය.

1.2 ණය ප්‍රමාණය

I. අදාල කාර්යය සඳහා නියත වශයෙන්ම වියදම් වන මුදල හෝ මාස 05 ක වැටුප් උපරිමය යන දෙකින් අඩු මුදල ('වැටුප්' ලෙස ගණන් ගනයුත්තේ සියලු දීමනා සහිත සම්පූර්ණ වැටුප පමණකි.)

1.3 ණය ලබාගතහැකි කාර්යය

I. සේවකයාගේ පවුලේ අයකු ගේ අවමංගල්‍යයනට වූ වියදම්.
II. සේවකයාගේ හෝ පවුලේ අයකු ගේ අසනීපයක් නිසා වැය වූ වෛද්‍ය වියදම්
III. සුළඟින්, ගින්නෙන් හෝ ගංවතුරෙන් නිලධාරියාට මුහුණපෑමට වූ ආපදාවක්.
IV. නිලධාරියාට හෝ ඔහුගේ භාර්යාවට හෝ අයත් පදිංචිව සිටින නිවස අලුත්වැඩියාව සඳහා යන වියදම.
V. තම දරුවන්ට පාසැල් උපකරණ ලබා දීමට වැය වන මුදල.
VI. පදිංචියට තමාට හෝ භාර්යාවට නිවසක් නොමැති නම් කුලියට ගැනීම අපේක්ෂිත නිවසක් සඳහා අත්තිකාරම් මුදල් ගෙවීමට යන වියදම.